2015.01.16

චක්‍රලේඛ අංක: බ.කො.ජ./06/2015


සියළුම බන්ධනාගාර අධිකාරි/සහකාර බන්ධනාගාර අධිකාරි

<u>ආරක්ෂණ රැගෙන යාමේදි විධිමත් ක්‍රියාපිළිවෙතක් අනුගමනය</u>
<u>කිරීම හා වියදම් අවම කිරීම.</u>

දිවයිනේ පිටස්තර බන්ධනාගාර ආයතන වලින්, සති අන්තවල කොළඹ බන්ධනාගාර ආයතන වලට ආරක්ෂණ රැගෙන ඒමේදි හා, කොළඹ බන්ධනාගාර ආයතන වලින්, පසු ආරක්ෂණ රැගෙන යාමේදි, විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකරන බව වාර්තාවේ. එබැවින්, රජයට විශාල ඉන්ධන හා වෙනත් වියදම් දැරීමට සිදුවන අතරම, මෙහි ඵලදායීතායක්ද නොමැත. කරුණු එසේ හෙයින්, මින් ඉදිරියට වහාම ක්‍රියාත්මක වන පරිදි, පිටස්තර බන්ධනාගාර ආයතන වලින් සතිඅන්තවල ආරක්ෂණ රැගෙන ඒමේදි හා පසු ආරක්ෂණ රැගෙන යාමේදි මෙහි පහත දක්වා ඇති ක්‍රමවේදය අනුගමනය කළයුතු බව අවධාරණය කරමි. මෙම නියෝගයන්ට පටහැනිව කටයුතු කරන අධිකාරිවරුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන අතර, කාර්ය සාධන ඇගැයීම් වලදිද, මේ පිළිබඳව දැඩි සැළකිල්ලට ගෙන කටයුතු කරන බව දන්වමි.


**01.** <u>දුම්බර බන්ධනාගාරයෙන් පිටත් වන ආරක්ෂණ.</u>

පල්ලේකැලේ එළිමහන් සිරකඳවුරේ ආරක්ෂණ එහි අධිකාරි සමග සම්බන්ධීකරණයෙන් දුම්බර බන්ධනාගාරයට ගෙන්වාගෙන කෑගල්ල අඹේපුස්ස යන ආයතනවල ආරක්ෂණද රැගෙන කොළඹ ආයතන වලට පැමිණිය යුතුය. පසු ආරක්ෂණයේදී මෙපරිදීම එම ආයතන වල ආරක්ෂණ රැගෙන පැමිණීම සිදුකල යුතුය.




## 05. ගාල්ල බන්ධනාගාරයෙන් පිටත්වන ආරක්ෂණ.

ගාල්ල බන්ධනාගාරය විසින් කළුතර බන්ධනාගාරයේ අධිකාරීවරයා සමග සාකච්ඡා කර කළුතර ආරක්ෂණය සමග කොළඹ ආයතන වලට පැමිණීම සිදු කල යුතුය. පසු ආරක්ෂණයද එපරිදි ආරක්ෂණය රැගෙන ආපසු පැමිණීම සිදු කල යුතුය.





## 06. මඩකලපුව බන්ධනාගාරයෙන් පිටත් වන ආරක්ෂණ.

මඩකලපුව ආයතනනේ පිටත් වී පොළොන්නරුව , වාරියපොල යන ආයතනවල ආරක්ෂණ රැගෙන කොළඹ ආයතන සඳහා පැමිණීම සිදුකල යුතු අතර පසු ආරක්ෂණයේදී ද මතු දැක්වූ ආයතන වල ආරක්ෂණ රැගෙන ආපසු පැමිණීම සිදුකල යුතුය.





## 07. මීගමුව බන්ධනාගාරයෙන් පිටත් වන ආරක්ෂණ

පල්ලන්සේන ත.ව.වි.මධ්‍යස්ථානයේ අධිකාරීවරයා සමග සම්බන්ධිකරණය කර එහි ආරක්ෂණ මීගමුව බන්ධනාගාරයට ගෙන්වාගෙන මහර බන්ධනාගාරයේ ආරක්ෂණද රැගෙන කොළඹ ආයතන වලට පැමිණීම සිදු කල යුතුය. පසු ආරක්ෂණයේදීද එලෙසම මතු දැක්වූ ආයතන වල ආරක්ෂණයන්ද රැගෙන ආපසු පැමිණීම සිදුකල යුතුය.




**02. අනුරාධපුර ආයතනයෙන් පිටත්වන ආරක්ෂණ.**

ත්‍රිකුණාමලය , යාපනය හා වවුනියාව යන බන්ධනාගාරවල ආරක්ෂණ එම ආයතනවල අධිකාරීන් සමඟ සාකච්ඡා කර අනුරාධපුර බන්ධනාගාරයට ගෙන්වා ගෙන ඉන් අනතුරුව කොළඹ ආයතනවෙත එම ආරක්ෂණ රැගෙන ඒම සිදුකල යුතුය. පසු ආරක්ෂණයේදීද මෙපරිදීම ඉහත දැක්වූ ආයතන වල ආරක්ෂණ රැගෙන ආපසු පැමිණිය යුතුය.





**03. බදුල්ල බන්ධනාගාරයෙන් පිටත් වන ආරක්ෂණ.**

මොණරාගල , හා තල්දෙන යන ආයතන වල ආරක්ෂණ එම ආයතන වල අධිකාරීන් සමඟ සාකච්ඡා කර බදුල්ල බන්ධනාගාරය වෙත ගෙන්වාගෙන අනතුරුව කුරුවිට බන්ධනාගාරයේ ආරක්ෂණද රැගෙන කොළඹ ආයතන වෙත පැමිණීම සිදුකල යුතුය. පසු ආරක්ෂයේදීද මෙපරිදීම මතු දැක්වූ ආයතන වල ආරක්ෂණද රැගෙන ආපසු පැමිණීම සිදුකල යුතුය.





**04. තංගල්ල බන්ධනාගාරයෙන් පිටත් වන ආරක්ෂණ.**

වීරවිල ආයතනයේ ආරක්ෂණ එහි අධිකාරීවරයා සමග සාකච්ඡා කර තංගල්ල බන්ධනාගාරය වෙත ගෙන්වා ගෙන ඉන් අනතුරුව මාතර බන්ධනාගාරයේ ආරක්ෂණද රැගෙන කොළඹ ආයතන වලට පැමිණීම සිදුකල යුතුය. පසු ආරක්ෂයේදීද මෙපරිදීම මතු දැක්වූ ආයතන වල ආරක්ෂණද රැගෙන ආපසු පැමිණීම සිදුකල යුතුය.



තවද මෙම ආරක්ෂණ වල සම්බන්ධීකරණ ආයතනය ලෙස කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය කටයුතු කලයුතු අතර, සති අන්තවල, බන්ධනාගාර ආයතන එකකින් හෝ කිහිපයකින් කොළඹ බන්ධනාගාර ආයතනවලට ආරක්ෂණ නොයෙදෙන්නේ නම්, සඳහන් කර ඇති පරිදිම, එම බන්ධනාගාර ආයතනයට හෝ ආයතන කිහිපයට ආරක්ෂණයක් සැලසුම් කළයුතුය. උදාහරණයක් ලෙස,




එසේම, ආයතන වලින් පැමිණෙන සෑම ආරක්ෂණයක්ම, පසු ආරක්ෂණයක් තිබේද යන්න කොලඹ බන්ධනාගාර ආයතන වලින් පෙරදින නිළ දුරකථන පණිවුඩ මගින් සනාථ කරගෙන, රැගෙන යාමට ආරක්ෂණ ඇත්නම් අනිවාර්යෙන්ම පසු ආරක්ෂණ රැගෙන යෑම සිදුකල යුතුය. පිටස්තර බන්ධනාගාර වලින් පැමිණෙන ආරක්ෂණ, පැමිණීම සනාථ කිරීම සඳහා, ආයතනය, දිනය, වේලාව, රැගෙන පැමිණි සිර/සැක සංඛ්‍යාව ආදී විස්තර සටහන් කිරීම හා පැමිණි මාන්ඩලික නිළධාරියාගේ අත්සන් තැබීම සඳහා, ලේඛණයක් පවත්වාගෙන යායුතුය. මෙම කටයුතු නිසි පරිදි සිදුවන්නේද යන්න කොළඹ රිමාන්ඩ් බන්ධනාගාර අධිකාරීවරයා විසින් අධීක්ෂණය කලයුතුය. තවද, ආරක්ෂණ නැවත අදාල ආයතනය වෙත ආරක්ෂණය රැගෙන ගිය පසුව, එය සනාථ කිරීම සඳහා, තම ආයතනයට ආරක්ෂණය ගිය වේලාව සම්බන්ධව දුරකථන පණිවිඩයක් කොළඹ රිමාන්ඩ් බන්ධනාගාර අධිකාරීවරයා වෙත එවිය යුතුය. ආරක්ෂණයක් සිදුකල පසු අතපසුවීමකින් සිර/සැකකරුවෙක් හෝ පිරිසක් ආරක්ෂණය කිරීමට නොහැකි වූයේ නම්, එම වරද සිදුකල නිළධාරීන්ටද ලියාපදිංචි කිරීමේ අංශ භාර ජේලර්වරයාටද විරුද්ධව විනයානුකූලව පියවර ගන්නා බව දන්වන අතර සිරකරුවා නැවත අදාල බන්ධනාගාරයට යැවියයුතුවන පිරිවැය අදාල නිළධාරීන්ගෙන් අයකිරීමට කටයුතු කරනු ලැබේ.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පිටපත් :
1. බන්ධනාගාර කොමසාරිස්(ක්‍රියාකාරි)
2. බන්ධනාගාර අධිකාරි, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය.